වරකාපොල ප්‍රාදේශීය සභාව,

කෑගල්ල දිස්ත්‍රික්කය

--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට වරකාපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේ දී නිරීක්ෂණය කළ පහත සඳහන් අඩුපාඩු නිවැරදිකර නොතිබුණි.

(i) 2015 වර්ෂය අවසානයේ පැවති රු.46,350 ක් වූ කාබනික පොහොර තොගය අවසන් තොග යටතේ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වත්කම් වල අගය අඩුවීම.

(ii) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර තිබුණු අක්කර 06 කුත් පර්චස් 14 ක් වූ ඉඩම් කොටස් 16 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබීම.

(ආ) සමාලෝචිත වර්ෂයේදි ආදායම් විෂයයන් 03 කට අදාලව ලැබී තිබූ රු.641,230 ක් කලින් ලැබීම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම අඩුවෙන් හා වර්ෂය අවසානයට බැරකම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට නිමකල කර්මාන්ත 453 ක වටිනාකම රු.111,839,912 ක් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම්ගත කර නොතිබීම නිසා වර්ෂයේ ප්‍රාග්ධන ලැබීම් හා වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත සඳහා රු.42,530,107 ක් ලැබීමට හා ගෙවීමට තිබූ නමුත් එම වටිනාකම ණයගැතියන් හා ණයහිමියන් යටතේ දක්වා නොතිබුණි.

(ඉ) සභාවට අයත් සෞඛ්‍ය ගොඩනැගිල්ල ඉදිකිරීමට හා බැකෝ යන්ත්‍රය මිලදී ගැනීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා ගෙවිය යුතු ශේෂය රු.17,799,331 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය රු. 12,216,324 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ පරිදි අබලි ද්‍රව්‍ය ලෙස වෙන්දේසි කිරීම මඟින් අලෙවිකර තිබූ රු.5,600 ක් වූ අබලි ද්‍රව්‍ය වලට අදාල ප්‍රාග්ධන වත්කම් හඳුනාගෙන අදාල වත්කම් ගිණුම් වලින් හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුමෙන් ඉවත්කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

-------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 13 කට අදාල ශේෂයන්ගේ එකතුව රු.155,830,743 ක් වූ අතර ඊට අදාල උපයෝගි ලේඛණ / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.191,066,808 ක් වූයෙන් වෙනස රු. 35,236,065 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂය ඉක්මවූ ආදායම් ණයගැති ශේෂය රු.14,114,882 ක් විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂය ඉක්මවූ ණයහිමි ශේෂය රු.19,791,172 ක් විය.

1.3.4 නීති,රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

-----------------------------------------

පහත දැක්වෙන නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158(1) (අ) වගන්තිය | වරිපනම් බදු හෝ අක්කර බදු නොගෙවූ විට දේපල තහනමට ගෙන විකිණීමෙන් හෝ මුදල් අයකල යුතු වුවත් වරිපනම් කොට්ඨාශ පහක වරිපනම් ඒකක 7,170 කින් 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු. 8,936,095 ක හිග වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා ( මුල්‍ය හා පරිපාලන) රීති33 | ගෙවීම් පැහැරහරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් හා දේපල තහනම් කිරීමේ වරෙන්තුවක් එක් එක් කාර්තුව අවසානයේ පිළියෙල කොට සභාපතිවරයාගේ/නිසි බලධරයාගේ අත්සනට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ.139 | වවුචරයේ මතුපිට "ගෙවන ලදී" මුද්‍රාව නොතබා එකතුව රු.167,600 ක් වටිනා වවුචර් 4 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |
| (ii) මු.රෙ.396 (ඇ) | රු.26,830 ක් වූ නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් 15 ක් සම්බන්ධව රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මු.රෙ.571(2) | වසර 2 ක් ඉක්මවූ ඉකුත් තැන්පත් රු.750,155 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික | ස්ථාන මාරුවී ගිය නිලධාරින් 04 දෙනෙකුගෙන්, |

| | |
|---|---|
| සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xxiv වන පරිච්ඡේදය 1.6 හා 4 වගන්තිය | විශ්‍රාමික නිලධාරීන් 03 දෙනෙකුගෙන්, සේවය හැරගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් හා අය නොවීමට හේතු හඳුනා නොගත් එක් අයකු වශයෙන් නිලධාරීන් 12 දෙනෙකුගෙන් 1998 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල අයවිය යුතු රු.279,440 ක සේවක ණය මුදල් අයකරගෙන නොතිබුණි. |
| (ඉ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2014 දෙසැම්බර් 29 දිනැති 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 2 වැනි වගන්තිය | 2014 ඔක්තෝබර් 24 වැනි දිනට අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්ට ස්ථිර පත්වීම් ප්‍රදානය කළ යුතු වුවත් 2014 ජනවාරි 01 දින සිට 2014 ඔක්තෝබර් 24 දිනට එක් දිනක් හෝ සේවයේ යෙදී නොසිටි සේවකයින් දෙදෙනෙකු හා දින 20 ක් පමණක් සේවය කර ඇති එක් සේවකයෙකු සඳහා ද ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචන

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම වූ රු.23,527,420 ක් වූ අතර ඊට අනුරූපි ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.10,422,545 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිපලයේ රු.13,104,875 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,104,875 ක වර්ධනයට ආදායම් විෂයයන් 4 ක වැඩිවීම හා වියදම් විෂයයන් 4 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

-----------------------

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2016.01.01 දිනට හිඟය | 2016.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2016 වර්ෂයේ බිල් කිරීම | වර්ෂයේ බිල් කිරීම් වලින් අයවීම | 2016.12.31 දිනට හිඟය 2016.01.01 දිනට පැවති හිඟයෙන් හිඟ | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 9,054 | 3,108 | 6,377 | 4,152 | 5,946 | 2,225 | 8,171 |
| (ii) බදු කුලී | 828 | 828 | 4,087 | 3,152 | - | 936 | 936 |
| (iii) බලපත්‍ර ගාස්තු | | | | | | | |
| (iv) වෙනත් ආදායම් | 22,751 | 18,613 | 75,844 | 47,661 | 4,138 | 28,183 | 32,321 |
| එකතුව | 32,633 | 22,549 | 86,308 | 54,965 | 10,084 | 31,344 | 41,428 |

### 2.3.2 වරිපනම් බදු

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 05 කට වරක් වරිපනම් බදු තක්සේරුවක් සිදු කල යුතු වුවත් 2008 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහාද වරිපනම් බදු අය කරමින් පැවතුණි.

(ආ) කාලානුරූපව සභා බල ප්‍රදේශය තුල ඇති නව සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන නියමිත පරිදි ගැසට් කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වරකාපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අක්කර බදු ඒකක 559 කින් 2016 දෙසැම්බර් 31 දිනට රු. 430,430 ක හිඟ ශේෂයක් පැවති අතර එයින් රු.393,474 ක් වර්ෂයට වඩා පැරණි ශේෂ විය.

2.3.3 විනෝද බදු

-------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විනෝද බදු ආඥා පනතේ 2 වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව සංදර්ශන සඳහා නිකුත් කරන ප්‍රවේශ පත්‍ර වලින් සියයට 25 ක් හා සිනමා ශාලා සඳහා නිකුත් කරන ප්‍රවේශපත්‍ර වලින් සියයට 7.5 ක විනෝද බදු මුදල් අය කර ගැනීමට 2015 ජූලි 28 දින පැවති මහා සභාවේදී සම්මත කර ගෙන තිබුණි. ඒ අනුව සිනමා ශාලාවල ටිකට් අලෙවිය පිළිබඳව දෛනික වාර්තාවක් ආදායම් පරීක්ෂකවරුන් විසින් සභාවට ඉදිරිපත් කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර 2016 නොවැම්බර් 10 දින වනවිට සිනමා ශාලා 2 කින් ලැබිය යුතු විනෝද බදු මුදල් එකතුව රු.178,201 ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) සභාව මගින් සීල් කරන ලද ටිකට්පත් පමණක් සිනමා ශාලා වෙත නිකුත් කළයුතු අතර ඒ අනුව ටිකට්පත් සඳහා සියයට 7.5 ක් විනෝද බදු අයකර ගැනීම වෙනුවට සිනමා ශාලා හිමිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ටිකට්පත් අලෙවි විස්තර අනුව සියයට 7.5 ක විනෝද බදු අයකිරීම හේතුවෙන් අයවිය යුතු මුළු විනෝද බදු ආදායම සභාවට අයවී ඇති බව තහවුරු නොවුණි.

2.3.4 බලපත්‍ර ගාස්තු

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සෑම වර්ෂයක් ආරම්භයේම සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් සිදු කර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 156(1) වගන්තිය ප්‍රකාර කර්මාන්ත ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ව්‍යාපාර බදු, වෙළඳ බලපත්‍ර සඳහා වූ ඉල්ලුම්පත්‍ර ලේඛනයක සටහන් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර වර්ෂය සඳහා ඉල්ලුම්පත් 629 ක් ලැබී තිබුණද බලපත්‍ර 402 ක් පමණක් නිකුත් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල පරිසර බලපත්‍ර නිකුත් කර තිබූ ආයතන 09 ක් වෙනුවෙන් වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඈ) පරිසර බලපත්‍ර රහිතව පවත්වාගෙන යා නොහැකි ව්‍යාපාර 8 ක් සඳහා වෙළඳ බලපත්‍ර ලබා දී තිබුණි.

(ඉ) සංචාරක මණ්ඩල පනත යටතේ ලියාපදිංචි හෝටල්වල පෙර වර්ෂයේ ආදායමින් සියයට 01 ක බද්දක් ගෙවිය යුතු වුවත් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ලබා නොදී හෝටල් විසින් ඉදිරිපත් කරන ලද ලැබීම් වාර්තා පදනම් කරගෙන බදු අයකර තිබුණි. ඊට අමතරව බල ප්‍රදේශය තුළ පවතින සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් සංඛ්‍යාව හඳුනා ගැනීමට වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

2.3.5 වෙනත් ආදායම්

-----------------

(අ) කසල බදු

------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බල ප්‍රදේශය තුල කසල බදු අයකරගත හැකි කර්මාන්ත හා ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් සිදු කර කසල බදු ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) කසල බදු අය කරන ආයතන 4 කින් 2016 නොවැම්බර් වන විට රු.186,000 ක් හිගව තිබුණු අතර හිග කාලය මාස 12 සිට මාස 38 දක්වා විය.

(ආ) හිග කඩකාමර කුලී

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i ) සභාව සතු කඩකාමර කුලී ගෙවීම් වල ප්‍රමාදයක් පැවති අතර ඌරු මස් කඩය සඳහා 2016 අප්‍රේල් සිට නොවැම්බර් දක්වා බදු කුලිය හා දඩ රු.67,816 ක් අයවී නොතිබුණි.

(ii) 2016 සැප්තැම්බර් 03 දින දක්වා මධ්‍යම වෙළඳ සංකීර්ණයේ පොදු ජල සැපයුමට අදාලව රු.21,842 ක ජල ගාස්තු හිගව පැවතුණු අතර මස් කඩ, මාළු කඩ හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල ආදිය සඳහා වෙනම ජල සබඳතා ලබා නොදීම ඊට හේතු වී තිබුණි.

(ඇ) වාහන නැවැත්වීමේ ගාස්තු

-------------------------------

2008 වර්ෂයේ පනවා ඇති අතුරු ව්‍යවස්ථාව අනුව වාහන නවතා තැබීමේ ගාස්තු අයකර නොතිබුණ අතර, ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු පමණක් අයකර තිබුණි. විධිමත් පරිදි නැවතුම්පල ස්ථාන හා ලියාපදිංචි රථවාහන ප්‍රමාණය ගණනය කර ගාස්තු අයකිරීමට කටයුතු නොකිරීමෙන් ලබාගත යුතුව තිබූ ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) දැන්වීම්පුවරු ගාස්තු

---------------------

සභාව මඟින් 2016 ජුනි සිදු කරන ලද සමීක්ෂණයේදී සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරමින් පැවති බවට හඳුනා ගෙන තිබුණු ස්ථිර දැන්වීම් 54 ක් සඳහා අයවිය යුතු රු.189,000 ක් 2017 අප්‍රේල් 18 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම රු. 5,776,338ක් හා මුද්දර ගාස්තු ආදායම රු.17,846,554 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 පෙබරවාරි 06 දිනැති ව අත්සන් කර ඇති ගිවිසුම අනුව තුල්හිරිය ග්‍රාම සේවා වසමේ මොන්රෝවියාවත්ත ඉඩමේ පස්කපා ප්‍රවාහනය කිරීමේදී ප්‍රාදේශීය සභා මාර්ගයක් වන නෙළුම්පොකුණගම මාර්ගයට සිදුවන හානි ප්‍රතිසංස්කරණය කිරීමට එකඟව තිබුණද සභාවේ කාර්මික නිලධාරි විසින් 2016 අගෝස්තු 31 දින පිළියෙල කල රු.1,300,000 ක ඇස්තමේන්තුව ප්‍රකාරව මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) මධ්‍යම රජය හා පළාත් සභාව මඟින් ප්‍රතිපාදන සලසා තිබූ රු.10,700,301 ක් වූ කර්මාන්ත 26 ක් 2016 දෙසැම්බර් 31 වනවිටත් ඉටුකර නොතිබුණි.

(ඇ) සභාව මඟින් ප්‍රතිපාදන සලසා තිබූ රු.2,100,000 ක කර්මාන්ත 7ක් ද සමාලෝචිත වර්ෂයේදී ඉටුකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව මඟින් පවත්වාගෙන යන මාහේන ජල යෝජනා ක්‍රමයේ පාරිභෝගිකයන් 29 දෙනෙකුගෙන් මාස 03 සිට මාස 09 දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු.62,893 ක ජල ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ආ) නිලධාරින්ගේ නොසැලකිල්ල හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.11,410 ක් වූ සේවක අර්ථසාධක අධිභාර ගෙවීම් වගකිවයුතු නිලධාරින්ගෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී රු.183,370 ක එලදා ආදායමක් ලැබූ සුසාන භූමි 05 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.117,000 ක ආදායම් ඇස්තමේන්තුවක් කර තිබුණද කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. එකී සුසාන භූමි වල තිබෙන පොල් හා රබර් වගාව නිසි පරිදි නඩත්තුවක් හා ආරක්ෂාවක් නොමැති බැවින් වගාව විනාශ වෙමින් පවතින බවද නිරීක්ෂණය විය.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

සභාව සතු අඹේපුස්ස පිහිටි කසල ප්‍රතිචක්‍රිකරණය කිරීමේ ස්ථානයේ 2013 වර්ෂයේ සිට කොම්පෝස්ට් නිෂ්පාදනය කරන අතර තුංතොට පිහිටි අක්කර 2 ක් පමණ වන ස්ථානයේ කොම්පොස්ට් ව්‍යාපෘතියේ ඉතිරි වන ඝන අපද්‍රව්‍ය හා අවට එක් රැස්වන කැලි කසල වල දැමීම හෝ අතුරා පස් දැමීම සිදුකර තිබුණි.

4. ගිණුම කටයුතු භාවය හා යහපාලනය

--------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනයේ ප්‍රතිපාදන වෙන්කර තිබුණු වැය විෂයයන් 38 ක එකතු ප්‍රතිපාදන රු. 4,760,000 ක් සියයට 100 ක් ද වැය විෂයයන් 26 ක එකතු ප්‍රතිපාදන රු.5,817,398 කින් සියයට 50 ත් සියයට 99 ත් අතරද, උපයෝජනය කර නොතිබුණි.

(ආ) වැය විෂයයන් 19 ක අනුමත ඇස්තමේන්තු ඉක්මවා රු.9,578,136 ක් වැය කර තිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

--------------------------

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මුල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | <u>පද්ධතිය</u> | <u>නිරීක්ෂණය</u> |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) කොම්පෝස්ට් තොග, කර්මාන්ත සඳහා ප්‍රාග්ධන ලැබීම් හා වියදම් ගිණුම්ගත නොකිරීම<br>(ii) ගිණුම් හා උපයෝගී ලේඛන අනුව ශේෂ සම නොවීම |
| (ආ) | අභ්‍යන්තර පාලනය හා පරීක්ෂාව | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක නොකිරීම |
| (ඇ) | හිග ආදායම් | වරිපනම්, උසාවි දඩ , මුද්දර ගාස්තු දැන්වීම් පුවරු ගාස්තු ආදී අයවිය යුතු හිගයන් පැවතීම |
| (ඈ) | අයවැය පාලනය | සියයට 100 ක් ඉතිරි වීම හා ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබීම |